# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2084/21 - 2018 අගෝස්තු මස 15 වැනි බදාදා - 2018.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ**

**උහන ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන උහන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ හේවා උලවවුගේ සුසන්ත අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම උහන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රත්නායක මුදියන්සේලාගේ ජයවීර රත්නායක නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

උහන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි ආර්.සසීලන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් රත්නායක මුදියන්සේලාගේ ජයවීර රත්නායක, උහන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ආර්.සසීලන්,
තේරීම්භාර නිලධාරි,
උහන ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 13 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර,

08-1033

1A - G 28278 - 17 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.